# ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය
# இலங்கை கடற்படை சமூகம
# SRI LANKA NAVAL ASSOCIATION

ඔබගේ අංකය. Your No.
මාගේ අංකය. My No. SLNA.11
දිනය. Date. 2026.05.17

**Patron** : **Commander of the Navy (ex–officio)**

Hony. President : Rear Admiral Rohan Amarasinghe, RSP, VSV, USP, psc, MNI (Lond), MNESA Centre (USA), (Retd)
Hony. Vice President : Rear Admiral Jayantha Gamage, RSP, USP, ndu, BA (DS), MSc (MS & NSSS), (Retd)
Hony. Secretary : MCPO AS Kumarapperuma, JP (WI), (Retd)
Hony. Treasurer : MCA (RL) AKR Athukorala, USP, JP, (Retd)


**ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ ගරු සාමාජික මහත්ම / මහත්මීන්ගේ අවධානය සඳහා**

**2026 වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳව දැනුම් දීම සහ සහභාගීත්වය තහවුරු කර ගැනීම**

යොමුව : 2026 මාර්තු මස 21 වන දිනැති සමාංක දරන ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ ගරු සභාපතිගේ ලිපිය.

1. ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම 2026 මාර්තු මස 28 වන දින Wave n' Lake Navy Hall උත්සව ශාලාවේ දී පැවැත්වීමට නියමිතව තිබූ අතර, මැදපෙරදිග කලාපය තුළ උද්ගත වූ යුධමය වාතාවරණය මත, රට තුළ ඇති වූ ඉන්ධන අර්බුධය හමුවේ රජය සහ නාවික හමුදාව මඟින් ගනු ලැබූ යම් යම් ක්‍රියාමාර්ග සැලකිල්ලට ගෙන 2026 මාර්තු මස 28 වන දින පැවැත්වීමට නියමිතව තිබූ වාර්ෂික මහා සභා රැස්වීම දින නියමයක් නොමැතිව කල්දැමීමට සංගමයේ විධායක කමිටුව විසින් ඒකමතිකව තීරණය කළ අතර, ඒ පිළිබඳව යොමු ලිපිය මඟින් සමස්ථ සාමාජිකත්වය දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

2. මේ වනවිට රට තුළ පැවති අර්බුධකාරී තත්වය යම්තාක් දුරට පහව ගොස් ඇති බැවින්, ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට නියමිත වැලිසර පිහිටි **Wave n' Lake Navy Hall උත්සව ශාලාව වෙන්කර ගතහැකි ආසන්නතම දිනය වන 2026 සැප්තැම්බර් මස 19 වන සෙනසුරාදි දින, මෙවර වාර්ෂික මහා සභා රැස්වීම** පැවැත්වීමට 2026 මැයි මස 09 වන දින පැවති විධායක කමිටු රැස්වීමේදී තීරණය කරන ලදී.

3. පෙර දැනුම්දුන් පරිදි තැපැල් සහ සේවා ගාස්තු ඉහළ යාම සහ මූල්‍ය වියදම් අඩුකර ගැනීමේ පියවරක් ලෙස, පසුගිය වාර්ෂික මහා සභා රැස්වීමේදී මෙන් සාමාජිකයින් වෙත ඉදිරිපත් කරනු ලබන සියලු වාර්තාවන් මෙවරද තැපැල් මඟින් යොමු නොකරන අතර, පසුගිය වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව, වර්ෂ 2025 මාර්තු මස 21වන දින සිට වර්ෂ 2026 මාර්තු මස 14වන දින දක්වා වාර්ෂික වාර්තාව, 2025 මුදල් වර්ෂයට අදාළ විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශනය සහ 2026 මුදල් වර්ෂයට අදාළ අයවැය ඇස්තමේන්තුව ඇතුළු සියලු වාර්තා ඇතුළත් පිටපත් 100ක් මුද්‍රණය කිරීමට කටයුතු කරන අතර, 2026 ජුලි මස 30වන දින සිට ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ ලේකම් කාර්යාලය වෙතින් තම සාමාජික අනන්‍යතාවය තහවුරු කර අදාළ වාර්තා ලබාගත හැකි බව දන්වා සිටිමු. තවද, ඉහත සඳහන් වාර්තා 2026 ජුලි මස 25 වන දිනෙන් පසු WhatsApp සහ E-SMS මඟින් ඔබ වෙත යොමු කිරීමට කටයුතු කරන අතර, **මින් ඉදිරියට පැවැත්වෙන වාර්ෂික මහා සභා රැස්වීම්, වාර්ෂික සුහද හමුවන් පිළිබඳව මෙන්ම අනෙකුත් සියලු පණිවිඩ හා දැනුම්දීම් WhatsApp, E-SMS, E-mail මඟින් පමණක් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.** එබැවින්, මෙම දැනුවත් කිරීම් ඉදිරියේදී ක්‍රමානුකූලව සිදුකිරීම සඳහා පහත සඳහන් පරිදි ඔබගේ විස්තර නාවික හමුදා සංගමයේ **077-0294281** යන WhatsApp අංකය වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

අ. සාමාජිකයාගේ නම සහ නිළය
ආ. සාමාජික අංකය
ඇ. WhatsApp අංකය

4. වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වෙන Wave n' Lake Navy Hall උත්සව ශාලාව වෙත රාගම, ඇලපිටිවල මාර්ගයේ ශ්‍රී ලංනාභෞ ලංකා ආයතනය වෙත පිවිසෙන මාර්ගය ඔස්සේ පැමිණිය හැකි අතර, 15 වැනි ඡේදය යටතේ දක්වා ඇති වැඩසටහන් විස්තරයට අනුගත වෙමින් උත්සව ශාලාව වෙත පැමිණෙන ලෙස ගෞරවයෙන් සාමාජික ඔබට ආරාධනා කරන්නෙමු. වාර්ෂික මහා සභා රැස්වීම සඳහා පැමිණෙන සමස්ත සාමාජිකත්වය සඳහා 'Splicing the mainbrace' නාවික චාරිත්‍ර සම්ප්‍රදාය ඉටු කරනු ලබන අතර, තම අවශ්‍යතාවය පරිදි Wave n' Lake Navy Hall උත්සව ශාලාවෙන් මධ්‍යසාර මිලදී ගැනීම සඳහා පහසුකම් සපයා ඇති බවත්, **පිටතින් මත්පැන් සහ ආහාර රැගෙන ඒමට අවසර නොමැති බැව් කාරුණිකව දැන්වේ.**

5. මෙවර වාර්ෂික මහා සභා රැස්වීම සඳහා පැමිණෙන බව සාමාජිකයින් 1081 දෙනෙකු සනාථ කර තිබූ අතර, ඉන් සාමාජිකයින් 976 දෙනෙකු තම දිවා ආහාරය වෙනුවෙන් ගෙවිය යුතු මුදලින් කොටසක් එනම්, රු.500.00 ක මුදලක් සංගමය වෙත බැර කර ඇති අතර, ඉතිරි මුදල නාවික හමුදා සංගමය වෙතින් දරනු ලැබේ. එලෙස මුදල් බැර කරන ලද සහ සහභාගිත්වය සනාථ කරන ලද සියලුම සාමාජිකයින් 2026 සැප්තැම්බර් මස 19 වන සෙනසුරාදා දින පැවැත්වීමට නියමිත වාර්ෂික මහා සභා රැස්වීම සඳහා සහභාගී වන්නේද යන්න පිළිබඳව, **2026 ජුනි මස 07 වන දිනට ප්‍රථම අංක 077-0294281 යන WhtasApp අංකය වෙත පණිවිඩයක් එවීමෙන් හෝ 011-7193971** යන කාර්යාලීය දුරකතන අංකය වෙත ඇමතුමක් ලබාදී තම සහභාගිත්වය සනාථ කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

6. වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වෙන Wave n' Lake Navy Hall උත්සව ශාලාවේ ඇති ඉඩ පහසුකම් සහ රැස්වීමේ කටයුතු සාර්ථකව සංවිධාන කර ගැනීමේ අරමුණින්, මෙවර වාර්ෂික මහා සභා රැස්වීම වෙත **සාමාජිකයින් 1100** දෙනෙකු හට පමණක් අවශ්‍ය පහසුකම් සලසා දීමට කටයුතු කරන අතර, ඉහත '5' වන ඡේදය මඟින් සහභාගිත්වය තහවුරු නොකරන සාමාජිකයින් ප්‍රමාණය අනුව, **2026 ජුනි මස 07 වන දිනෙන් පසුව** තවදුරටත් වාර්ෂික මහා සභා රැස්වීම සඳහා සහභාගී වීමට අපේක්ෂාවෙන් පසුවන සාමාජිකයින් හටද අවස්ථාව ලබාදීමට කටයුතු කරන අතර, ඒ පිළිබඳව ඉදිරියේදී ඔබව දැනුවත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

7. එලෙස සහභාගී වීමට බලාපොරොත්තු වන සියලු සාමාජිකයින් **2026 ජුනි මස 07** වන දිනෙන් පසුව ඔබ වෙත සිදු කරනු ලබන දැනුවත් කිරීමෙන් පසුව, පහත සඳහන් ගිණුම් අංකය වෙත රු.500/= ක මුදලක් බැර කොට, මේ සමඟින් ඉදිරිපත් කරනු ලබන තැපැල් පතේ **ඔබගේ නම, නිලය, නිල අංකය සහ සාමාජික අංකය පැහැදිලිව සඳහන්** කර, **2026 අගෝස්තු මස 15 වන දිනට ප්‍රථම** ගරු ලේකම්, ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය, නාවික සංකීර්ණය, වැලිසර, රාගම යන ලිපිනය වෙත හෝ පහත සඳහන් දුරකථන අංකය වෙත WhtasApp මාර්ගයෙන් හෝ විද්‍යුත් තැපැල වෙත ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොමැති නම් නාවික හමුදා සංගම් ලේකම් කාර්යාලය වෙත පැමිණ භාර දීමට කටයුතු කළ හැක. තවද, එදිනට පසුව ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු නොකරන බව කාරුණිකව දන්වා සිටින අතර, මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු 077-5550166 යන දුරකථන අංක මඟින් සංගමයේ ගරු ලේකම්තුමා වෙතින් හෝ 0117193971 යන නාවික හමුදා සංගම් කාර්යාලයීය දුරකථන අංකය මඟින් විමසිය හැක.

| | | | |
|---|---|---|---|
| අ. | ගිණුම් අංකය | - | 316-2-001-6-1073235 |
| | ගිණුමේ නම | - | ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ පරිපාලන ඉතිරි කිරීමේ ගිණුම (Admin Saving Account) |
| ආ. | විද්‍යුත් තැපැල් ලිපිනය | - | slnasec13977@gmail.com |
| ඇ. | WhatsApp අංකය | - | 077 - 0294281 |

**Naval Complex, Welisara, Ragama, Sri Lanka - Tel. / Fax : 011 7193971 - E-mail : slnasso@navy.lk / slnasec13977@gmail.com**

8. මෙවර වාර්ෂික මහා සභා රැස්වීම වන විට පුරප්පාඩුව පැවති ගරු උපසභාපති, ගරු උපලේකම් සහ විධායක කමිටු ධූරයන් 16දෙනෙකු සඳහා නාම යෝජනා කැඳවූ අතර, එම සියලු ධූරයන් සඳහා නිතරඟයෙන් සාමාජිකයින් තේරීපත්වූ අතර, එම ධූර අපේක්ෂකයින්ගේ නාම යෝජනාවන් මෙවර වාර්ෂික මහා සභා රැස්වීම වෙත ඉදිරිපත් කර සභාසම්මත කර ගැනීමට නියමිතව තිබිණි. කරුණු එසේ වුවද, 2026 මාර්තු මස 27 වන දින සංගමයේ ගරු සභාපති වශයෙන් කටයුතු කරන ලද රියර් අද්මිරාල් ටිඑම්ජේ මෙන්ඩිස් (විශ්‍රාමික) ජ්‍යෂ්ඨ නිලධාරියාගේ අභාවය හේතුවෙන් පුරප්පාඩු වූ ධූරය සඳහා මීළඟ වාර්ෂික මහා සභා රැස්වීම වනතෙක් ව්‍යවස්ථානුකූලව නිලධාරීන් පත් කර ගන්නා ලද අතර, එකී නිලධාරීන්ගේ ධූර කාලය මෙවර වාර්ෂික සභා රැස්වීම දක්වා පමණක් බලාත්මක වේ. ඒ අනුව, සංගමයේ **ගරු සභාපති, ගරු උපසභාපති සහ එක් විධායක කමිටු ධූරයක්** සඳහා නාම යෝජනා කැඳවීමට කටයුතු කරන අතර, නාවික හමුදා සංගමයේ විධායක කමිටුව විසින් ගනු ලබන පොදු ප්‍රතිපත්ති හා තීන්දු, තීරණයන්ට එකඟව සද්භාවයෙන් මෙන්ම ක්‍රියාශීලීව සේවය කිරීමට කැමැත්තක් දක්වන සාමාජිකයින් හට සංගමයේ ව්‍යවස්ථාවට අනුකූලව එම ධූරයන් සඳහා නාම යෝජනා ඉදිරිපත් කළ හැක.

9. නාමයෝජනා ඉදිරිපත් කිරීමේ දී, මේ සමඟ ඉදිරිපත් කරනු ලබන නාමයෝජනා ආකෘතිපත්‍රය පැහැදිලි අත්අකුරින් සම්පූර්ණ කර, නාවික හමුදා සංගම් ලේකම් කාර්යාලයට පැමිණ හෝ නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් පමණක් ලැබීමට සැළැස්විය හැක. නාමයෝජනා ආකෘතිපත් ඉදිරිපත් කරනු ලබන ධූර අපේක්‍ෂකයා, යෝජනාකරු සහ ස්ථිරකරු තමන් විසින්ම ස්වකීය අත්සන යොදා ඉදිරිපත් කළ යුතු අතර, ඉන් පරිබාහිරව ඉදිරිපත් කරන නාමයෝජනා ප්‍රතික්ෂේප කරන බව කාරුණිකව දැන්වේ. **නාමයෝජනා භාර ගැනීම, 2026 සැප්තැම්බර් මස 04වන සිකුරාදා දින 1200 පැයට අවසන්වන අතර, එම වේලාවෙන් පසු ලැබෙන නාමයෝජනා ප්‍රතික්ෂේපිත ලේඛනයේ සඳහන් කර, ඉදිරි කටයුතු සඳහා භාවිතා නොකරන බැව් වැඩිදුරටත් දැන්වේ.**

10. වත්මන් විධායක කමිටුවේ සංකල්පයකට අනුව, නාවික හමුදා සංගමයේ සාමාජිකයින් අතර අළෙවි කිරීම සඳහා ටී කමිසයක් (T-Shirt) සහ හිස් වැසුමක් (Cap) නිර්මාණය කර ඇති අතර, වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වෙන දින පහත සඳහන් මිල ගණන් යටතේ එම ටී කමිස (T-Shirt) සහ හිස් වැසුම් (Cap) මිලදී ගැනීමට පහසුකම් සලසා ඇත.

| | | | |
|---|---|---|---|
| අ. | ටී කමිසයක් (T Shirt) | - | රු.1,400/= |
| ආ. | හිස් වැසුමක් (Cap) | - | රු.500/= |

11. නැංගුරම (Anchor) සඟරාව පහසුවෙන් පරිශීලනය කළ හැකි පරිදි විද්‍යුත් සඟරාවක් (E- Magazine) ලෙස අර්ධ වාර්ෂිකව එළි දක්වනු ලබන අතර, මෙවර ද වාර්ෂික මහා සභා රැස්වීමට සමගාමීව එය එළි දැක්වීමට කටයුතු සිදු කෙරේ.

12. මෙවර වාර්ෂික මහා සභා රැස්වීමේදී සංගමයේ දැනට බලාත්මක ව්‍යවස්ථාවෙහි සංශෝධනයන් සිදු කිරීම සඳහා කටයුතු කරනු ලබන අතර, ඒ සඳහා වූ ව්‍යවස්ථා සංශෝධන යෝජනාවන්හි අවසන් කෙටුම්පත ඉදිරියේ දී WhatsApp සහ E-SMS මාර්ගයෙන් සංගමයේ සාමාජිකයින් වෙත යොමු කරන අතර, තම සාමාජික අනන්‍යතාවය තහවුරු කර ලේකම් කාර්යාලය වෙතින් එහි පිටපතක්, උක්ත '2' වන ඡේදයේ සඳහන් පරිදි ලබාගත හැකි බව කාරුණිකව දැන්වේ.

13. වර්ථමානය වන විට යම්තාක් දුරට නාවික හමුදා බස් රථ සේවාවන් සාමාන්‍ය පරිදි ධාවනය වන බැවින්, වාර්ෂික මහා සභා රැස්වීම සඳහා පැමිණෙන සාමාජිකයින්ගේ ගමන් පහසුව පිළිබඳව සලකා බලා නාවික හමුදා සුභසාධන බස්රථ සේවාව ක්‍රියාත්මක වන නගර ආවරණය වන පරිදි මෙන්ම, එම බස් රථ සේවාවන් ක්‍රියාත්මක නොවන ප්‍රදේශයන් ආවරණය කරමින් පහත පරිදි බස් රථ සේවාවක් ක්‍රියාත්මක කරන ලෙස නාවික හමුදා මූලස්ථානය වෙතින් පෙර පරිදිම ඉල්ලා ඇති අතර, නාවික හමුදාධිපතිතුමාගේ අනුමැතිය මත මෙම බස් රථ සේවාවන් ක්‍රියාත්මක කරන බව කාරුණිකව දන්වා සිටිමි. **යම් හෙයකින්, නාවික හමුදාව මඟින් එම බස් රථ ලබා ගැනීමට නොහැකි වුවහොත්, ඒ පිළිබඳව ඉදිරියේදී ප්‍රාදේශීය සංගම් මඟින් හෝ WhatsApp මාර්ගයෙන් ඔබට දැනුම් දීමට කටයුතු කරන බව දන්වා සිටිමි.**

<u>නාවික හමුදා සුභසාධක බස් රථ සේවය</u>

අ. හොරණ නගරයේ සිට.
ආ. අවිස්සාවේල්ල නගරයේ සිට (පහළ පාර).
ඇ. කළුතර නගරයේ සිට ආරම්භ වන සුභසාධක බස් රථය මතුගම නගරයේ සිට ආරම්භ වන පරිදි.
ඈ. වාරියපොළ නගරයේ සිට.
ඉ. කුරුණෑගල නගරයේ සිට.
ඊ. නාරම්මල නගරයේ සිට (අංක 5 පාර).
උ. මාරවිල නගරයේ සිට.
ඌ. කිරිදිවැල නගරයේ සිට
එ. කෑගල්ල නගරයේ සිට.
ඒ. අලුත්ගම නගරයේ සිට.
ඔ. කොළඹ කොටුව දුම්රිය ස්ථානයෙන් 0645 පැයට සහ 0730 පැයට උත්සව ශාලාව දක්වා බස් රථ 02ක් පිටත්වේ (දුම්රියෙන් පැමිණෙන සාමාජිකයින්ගේ පහසුව සඳහා).

ඕ. රාගම දුම්රිය ස්ථානයේ සිට උත්සව ශාලාව දක්වා 0700 පැයට සහ 0745 පැයට බස් රථ පිටත්වේ (දුම්රියෙන් පැමිණෙන සාමාජිකයින්ගේ පහසුව සඳහා).

<u>විශේෂ බස් රථ සේවය</u>

| | | | |
|---|---|---|---|
| අ. | මහනුවර නගරයේ සිට | - | උදෑසන 0500 පැයට. |
| ඇ. | මාතලේ පොලිස් ස්ථානය අසල සිට | - | උදෑසන 0400 පැයට. |
| ආ. | බදුල්ල පොලිස් ස්ථානය අසල සිට | - | උදෑසන 0100 පැයට. |
| ඈ. | අනුරාධපුර නගරයේ සිට | - | උදෑසන 0300 පැයට. |
| ඉ. | ගාල්ල නගරයේ සිට | - | උදෑසන 0500 පැයට. |
| ඊ. | තංගල්ල නගරයේ සිට | - | උදෑසන 0500 පැයට. |

14. මෙම බස් රථ වාර්ෂික මහා සභා රැස්වීම අවසන් වීමෙන් පසු 1600 පැයට ආපසු ඉහත දක්වා ඇති ස්ථානයන් වෙත පිටත්වේ.

15. **වැඩසටහන් විස්තරය**

| | | | |
|---|---|---|---|
| අ. | 0730 - 0900 | - | සාමාජිකයින් ඇතුළත් කිරීම ලේඛන ගත කිරීම. |
| ආ. | 0900 - 1330 | - | 2026 වාර්ෂික මහා සභා රැස්වීම ආරම්භ කිරීම සහ පැවැත්වීම. |
| ඇ. | 1330 - 1430 | - | සච්දිය පිරීම. |
| ඈ. | 1430 - 1500 | - | දිවා ආහාරය. |
| ඉ. | 1530 | - | රැස්වීමේ නිමාව. |

16. එදින වාර්ෂික මහා සභා රැස්වීම සඳහා සහභාගී වන සාමාජිකයින් හට අවශ්‍ය උදෑසන කෙටි ආහාර ලබා ගැනීම සඳහා සේවා වනිතා සුභසාධක වෙළඳ සැලක් Wave 'n Lake Navy Hall පරිශ්‍රය තුළ ස්ථාපනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන අතර, එමගින් ඔබ හට අවශ්‍ය පහසුකම් සලසා ඇත.

17. **ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම - 2026 න්‍යාය පත්‍රය**

අ. වාර්ෂික මහා සභා රැස්වීමේ ආරම්භය.
ආ. නාවික හමුදා සංගමයේ තේමා ගීතය වාදනය කිරීම.
ඇ. සම්ප්‍රදායානුකූලව පොල් තෙල් පහන දැල්වීම.
ඈ. මියගිය සාමාජිකයින් හා රණවිරුවන් වෙනුවෙන් විනාඩි 02ක නිශ්ශබ්දතාවයක් පැවැත්වීම.
ඉ. වාර්ෂික මහා සභාව කැඳවීමේ නිවේදනය ප්‍රකාශයට පත් කිරීම.

ඊ. නොපැමිණීම පිළිබඳව දැනුම්දීම.
උ. ගරු සභාපතිතුමා වාර්ෂික මහා සභාව ඇමතීම.
ඌ. පූරප්පාඩු වූ ධූරයන් සඳහා අපේක්ෂකයින් තෝරා ගැනීමේ නිළවරණය ආරම්භ කිරීම.
එ. පසුගිය වාර්ෂික මහා සභා (2025) රැස්වීම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම, සාකච්ඡා කිරීම හා සම්මත කර ගැනීම.
ඒ. 2025 - 2026 වාර්ෂික වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම, සාකච්ඡා කිරීම හා සම්මත කර ගැනීම.
ඔ. 2025 මුදල් වර්ෂය තුළ විගණනය කරන ලද මූල්‍ය වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම, සාකච්ඡා කිරීම හා සම්මත කර ගැනීම.
ඕ. 2026 මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම් සහ වියදම් ප්‍රකාශය අනුමත කර ගැනීම.
ක. පොළොන්නරු රාජධානී නිවාඩු නිකේතන ව්‍යාපෘති යෝජනාව සභාගත කිරීම හා සම්මත කර ගැනීම.
ඛ. භාරකාර මණ්ඩලයේ ගරු සභාපතිතුමා වාර්ෂික මහා සභාව ඇමතීම.
ග. ව්‍යවස්ථා සංශෝධනයන් සඳහා වූ යෝජනාවන් සම්මත කර ගැනීම.
ස. නීති උපදේශක, මූල්‍ය උපදේශක සහ පරිපාලන උපදේශකයින් පත් කිරීම.
න. විනය කමිටුව පත්කර ගැනීම.
ට. යෝජිත විගණන ආයතනය අනුමත කර ගැනීම.
ඨ. යෝජිත අභ්‍යන්තර විගණකගේ නම අනුමත කිරීම.
ද. පුරප්පාඩුව ඇති ධූරයන් සඳහා සාමාජිකයින් පත් කර ගැනීම.
ධ. වෙනත් කරුණු සාකච්ඡා කිරීම.
න. ගරු ලේකම්තුමාගේ ස්තුති කතාව.
ප. වාර්ෂික මහා සභා රැස්වීමේ නිමාව.

18. මේ සම්බන්ධයෙන් සියලු සාමාජිකයින් අතර, ප්‍රසිද්ධියක් ලබාදීමට කටයුතු කරන මෙන් කරුණාවෙන් දැන්වේ.

ඒඑස් කුමාරප්පෙරුම, (සාවි මුදි)
ගරු ලේකම්
ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය

යාකිරීම් : 1. තැපැල් පත (උක්ත 6වැනි ඡේදය පරිදි).
2. නාමයෝජනා පත්‍රය (උක්ත 8වැනි ඡේදය පරිදි).

Naval Complex, Welisara, Ragama, Sri Lanka - Tel. / Fax : 011 7193971 - E-mail : slnasso@navy.lk / slnasec13977@gmail.com

## වාර්ෂික මහා සභා රැස්වීම
## 2026 සැප්තැම්බර් 19 වන
## සෙනසුරාදා දින
## සහභාගීවීම සනාථ කිරීම

සම්බන්ධීකරණය සඳහා : 011-7193971

රු.50.00
මුද්දරයක්
අලවන්න

ගරු ලේකම්
ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය
නාවික සංකීර්ණය
වැලිසර - රාගම
තැපැල් සංකේත අංකය

| | | | | |
|---|---|---|---|---|
| 1 | 1 | 0 | 1 | 0 |

## ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ වාර්ෂික මහා සභාරැස්වීම - 2026

(සන්නද්ධ හමුදා ප්‍රවීණයින්ගේ සංගමයේ අනන්‍යතා පත්‍රය රැගෙන ඒම අනිවාර්යය වේ)

## සහභාගීවීම සනාථ කිරීම

සාමාජිකයාගේ මුලකුරු සමඟ නම : .............................................................

සාමාජික අංකය : SLN/ [ ][ ][ ][ ][ ]

ක්‍රියාකාරී දුරකථන අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

වට්ස්ඇප් (Whatsapp) අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

ප්‍රවාහන පහසුකම් ලබාගැනීම : - නාහ බස් රථය වෙත ප්‍රවේශ වන ස්ථානය සඳහන් කරන්න
.......................................................................................
පෞද්ගලික වාහන අංකය : ................................................

දිනය : .....................................    අත්සන : ........................................

(මෙම තැපැල්පත 2026 අගෝස්තු මස 15 වන දිනට ප්‍රථම නාවික හමුදා සංගමය වෙත ලැබීමට සලස්වන්න)

ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ පුරප්පාඩු වූ පහත සඳහන් ධූරයන්හි සේවය කිරීමට කැමැත්තක් දක්වන සාමාජිකයින්හට එකී සංගමයේ ව්‍යවස්ථාවේ අටවැනි(08) ව්‍යවස්ථාවේ 'අ' හි i සහ ii වගන්ති අනුව, නාමයෝජනා ඉදිරිපත් කළ හැක.

1. ගරු සභාපති ධූරය - එක් ධූරයක් පමණි.
2. ගරු උප සභාපති ධූරය - එක් ධූරයක් පමණි.
3. ගරු විධායක කමිටු සාමාජික ධූර - එක් ධූරයක් පමණි.

**සැලකිය යුතුයි :** නාමයෝජනා ඉදිරිපත් කිරීමේ දී, නියමිත ආකාරයෙන් පැහැදිලි ලෙස නාම යෝජනා අකෘතිපත්‍රය පුරවා පැමිණ හෝ නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් පමණක් පසු පිටෙහි සඳහන් කර ඇති ලිපිනය භාවිතා කර, දක්වා ඇති වේලාවට ප්‍රථම ලැබීමට සැළැස්විය හැක.

ඉහතින් දක්වා ඇති පිළිවෙතට අනුව, නාමයෝජනා පත්‍ර ඉදිරිපත් කළ යුතු අතර, ඉන් පරිබාහිරව ඉදිරිපත් කරන නාමයෝජනා ප්‍රතික්ෂේප කරන බව කාරුණිකව දන්වමි. **නාමයෝජනා භාර ගැනීමේ අවසන් දිනය හා වේලාව 2026 සැප්තැම්බර් මස 04වන සිකුරාදා දින 1200 පැයෙන් අවසන් වන බව කාරුණිකව දන්වමි.**

## ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය - නාමයෝජනා පත්‍රය - 2026

ධූරය : ..........................................................................................

ඉහත ධූරයේ සේවය කිරීමට ..........................................................................................................

වන මම එකඟතාවය පළ කරමි.

අත්සන : ....................................................................... නිලය/ තරාතිරම :.............................................

සාමාජික අංකය : SLN/................................................ දිනය : ...........................................................

**යෝජනා කළේ**

නම : ............................................................................... නිලය/ තරාතිරම :.............................................

අත්සන :.................................. දිනය : ...................................සාමාජික අංකය : SLN/...........................

**ස්ථිර කළේ**

නම : ............................................................................... නිලය/ තරාතිරම :............................................

අත්සන :.................................. දිනය : ...................................සාමාජික අංකය : SLN/...........................